කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

සමාජීය විද්‍යා පීඨය

# ජාත්‍යන්තර අධ්‍යයනය

## ජාත්‍යන්තර සබඳතාවල ඓතිහාසික වර්ධනය - INTS 18224

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "එවකට ප්‍රංශය තුළ පැවති දූෂිත, අකාර්යක්ෂම පාලනය වෙනස් කොට ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකට මුල පිරීමෙහි ලා ප්‍රංශ විප්ලවය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකලද, ප්‍රංශ විප්ලවය තුළින් එරට ජනතාව බලාපොරොත්තු වූ සැබෑ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ඔවුන්ට හිමිවූවාද යන්න මතභේදයට තුඩුදෙන්නකි". සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

02. "දෙවන ලෝක යුද්ධය ඇතිවීම කෙරෙහි බලපෑ එක් ප්‍රධාන හේතුවක් ලෙස ජාතීන්ගේ සංගමය අසාර්ථක වීම සඳහන් කළ හැක". විමසන්න. (ලකුණු 20)

03. i. දහනමවන සියවසේ ඇමෙරිකා එක්සත් ජනපදයේ විදේශ ප්‍රතිපත්තියෙහි සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.

ii. රුසියානු විප්ලවය ඇතිවීම සඳහා බලපෑ ප්‍රධාන හේතු පැහැදිලි කරන්න.
(ලකුණු 10 x 2 = 20)

04. "දහනමවන සියවසේ ආසියානු කලාපය තුළ සිදුවූ එක් සුවිශේෂී සිදුවීමක් ලෙස ජපානයේ පිබිදීම සඳහන් කළ හැක". විමසන්න. (ලකුණු 20)

05. i. "දහනමවන සියවසේ යුරෝපීය රාජ්‍යයන් අතර යටත්විජිත සඳහා පැවති තරඟය න්‍යායාත්මක වශයෙන් අවකාශය සඳහා වූ තරඟය (Struggle for space) තුළින් පැහැදිලි කළ හැකිය". විමසන්න.

ii. "ජාත්‍යන්තර සම්බන්ධතාවන් හි දිශානතිය වෙනස් කළ ඉතා සුවිශේෂී සිදුවීමක් ලෙස තිස් අවුරුදු යුද්ධය (1618-1648) සඳහන් කළ හැකිය". විස්තර කරන්න.
(ලකුණු 10 x 2 = 20)

06. ලෝක ආර්ථික අර්බුදය (1929) ඇතිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතු විස්තර කරන්න.
(ලකුණු 20)

07. ඇමරිකානු නිදහස් අරගලය ඇතිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතු පැහැදිලි කරන්න.
(ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා පිළිබඳ සටහන් ලියන්න.
i. එක්සත් ජාතීන්ගේ සංවිධානය
ii. තුෂ්ණි යුද්ධය
iii. පුනරුද යුගය
iv. එක්සේසත් වීම ( ලකුණු 05 x 04 = 20)

************************************